# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 20 දරන
# වගකීමෙන් ආරක්ෂා කිරීමේ
# පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මැයි මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 මැයි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 20 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1982 අංක 20 දරන වගකීමෙන් ආරක්ෂා කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1982 මැයි මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 51/80.

**1977 අගෝස්තු මස 1 වන දින සිට 1977 අගෝස්තු මස 31 වන දින දක්වා වූ කාලය තුළ රටපුරා සාමය සහ නීතිය කඩවීමක් ඇති වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ කාලය තුළ නීතිය සහ සාමය පුනස්ථාපනය කිරීමේ අදහසින් කරන ලද හෝ කරන ලද්දේ යයි කියනු ලබන ඇතැම් ක්‍රියා සහ කාරණා සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන්ට විරුද්ධව නීති මගින් ක්‍රියා කිරීම සීමා කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1982 අංක 20 දරන වගකීමෙන් ආරක්ෂා කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. 1977 අගෝස්තු මස 1 වන දින සිට 1977 අගෝස්තු මස 31 වන දින දක්වා වූ කාලය තුළ දී නීතිය සහ සාමය පුනස්ථාපනය කිරීමේ අදහසින් නීත්‍යානුකූල වූ හෝ අන්‍යාකාර වූ යම් ක්‍රියාවක්, කාරණාවක් හෝ දෙයක් අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් හෝ නාවික හමුදා, යුද්ධ හමුදා, ගුවන් හමුදා, පොලිස් හෝ සිවිල් යන කවර හෝ තත්ත්වයකින් වුව ද ශ්‍රී ලංකා ආණ්ඩුව යටතේ ධුරයක් දරන හෝ සේවයේ නියුක්ත තැනැත්තකු විසින් හෝ අමාත්‍යවරයකුගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ හෝ එසේ ධුර දරන්නා වූ හෝ සේවයේ නියුක්ත කර ඇත්තා වූ තැනැත්තකුගේ විධානයක අධිකාරය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ සද්භාවයෙන් කරන ලද නම් සහ ස්වකීය කාර්ය කිරීමෙහි ලා හෝ නීතිය සහ සාමය ක්‍රියාත්මක කිරීම සඳහා හෝ මහජන ආරක්ෂාව සඳහා නැතහොත් අන්‍යාකාරයකින් පොදු යහපත පිණිස හෝ කරන ලද නම් හෝ කරන ලදැයි කියනු ලබන්නේ නම් එම ක්‍රියාව, කාරණාව හෝ දෙය සඳහා හෝ වෙනුවෙන් හෝ සම්බන්ධයෙන් යම් අධිකරණයක කවර හෝ සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීම හෝ නීති මගින් ක්‍රියා කිරීම හෝ කරනු නොලැබිය යුතු ය. තව ද මේ පනත ආරම්භ වන දිනයට පෙර හෝ ඉන් පසුව යම් අධිකරණයක එවැනි නඩුවක් හෝ නීති මගින් ක්‍රියා කිරීමක් ආරම්භ කර ඇත්නම් ඒ සෑම නඩුවක් ම හෝ නීති මගින් ක්‍රියා කිරීමක්ම නිෂ්ප්‍රභ කරන ලද ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ නඩුව හෝ නීති මගින් ක්‍රියා කිරීම අවලංගු හා බලරහිත කරනු ලැබිය යුතු ය. *සද්භාවයෙන් ක්‍රියා කළ තැනැත්තන්ට විරුද්ධව නීති මගින් ක්‍රියා කිරීම සීමා කිරීම.*

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.